සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 6 - 2017

නම : ............................................ සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය : පැය 2යි.

## I කොටස

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නූතන සිංහල අක්ෂර මාලාවෙහි ඇති ව්‍යඤ්ජන අක්ෂර ගණන,
(i) 40 කි. (ii) 30 කි.
(iii) 42 කි. (iv) 18 කි.

(2) උක්ත නාම පදය තෝරන්න.
(i) ගවයකු (ii) දැරියක
(iii) මවක් (iv) පියෙකු

(3) උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදය කුමක් ද?
(i) කියමු (ii) කියයි
(iii) කියහි (iv) කියමි

(4) 'ඇලපිල්ල' පමණක් යෙදුණු වචනය තෝරන්න,
(i) මලී (ii) මාලා
(iii) මේනු (iv) මාරි

(5) ''නංගී කතන්දර පොත කියවයි.'' යන වාක්‍යයේ උක්ත පදය කුමක් ද?
(i) කියවයි (ii) නංගී
(iii) කතන්දර (iv) පොත

- ❖ අංක 6 සිට 8 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල සමානාර්ථ පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(6) සූර්යයා
(i) තාරපති (ii) භූපති (iii) දිනපති (iv) අධිපති

(7) මව
(i) ජනනී (ii) අඹුව (iii) වනිතාව (iv) බිරිඳ

(8) විහඟ,
(i) සුළඟ (ii) අඳුර (iii) කුරුලු (iv) පැතුම

- ❖ අංක 9 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉරමත ලියන්න.

(9) පවිත්‍ර ..........................................................................

(10) කඩිසර ..........................................................................

❖ **අංක 11 සිට 14 තෙක් ප්‍රශ්නවල වගන්තියට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය
(i) ඥානය (ii) ළහිරු (iii) අඹ (iv) ප්‍රතිඵලය

(12) සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය
(i) හොඬය (ii) කඩය (iii) ළමයා (iv) ශිෂ්‍ය

(13) කොම්බුව සහ ගයනුකිත්ත, ඉස්පිල්ල පිළිවෙළින් යෙදුණු වචනය
(i) කෞතුක (ii) බෞද්ධ (iii) භෞතික (iv) සෞඛ්‍ය

(14) 'රෝගියා' යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන
(i) ර් + ඔ + ග් + අ + ය් + අ (ii) ර් + ඕ + ග් + ඉ + ය් + අ
(iii) ර් + ඖ + ග් + ඉ + ය් + ආ (iv) ර් + ඕ + ග් + ඊ + ය් + අ

❖ **අංක 15 සහ 16 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(15) (i) විශේශ (ii) ප්‍රථිඵල (iii) ප්‍රබුද්ද (iv) භාග්‍යය

(16) (i) කනිජ (ii) දර්ශණ (iii) පරීක්සනය (iv) පෝෂණය

❖ **අංක 17 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පද වරහන් තුළින් තෝරා ලියන්න.**

(17) දඩයක්කරුවෝ ............................................ (සතුන් / සත්තු) දඩයම් කරති.

(18) ගැහැනියක් අසරණ .................................................. (දූරියක / දූරියක්) රැක බලා ගනියි.

(19) .................................................. (ගුරුවරුන් / ගුරුවරු) අකීකරු සිසුන්ට අවවාද කළහ.

(20) .................................................. (වෙළෙන්දෝ / වෙළෙන්දා) බඩු හොරට කිරා විකුණයි.

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

❖ **1,2, හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන 150 ක පමණ රචනාවක් ලියන්න.

(i) ඉගෙනීමේ අගය
(ii) සිංහල අලුත් අවුරුද්ද
(iii) ප්‍රිය වචන කතා කරමු.
(iv) මා දුටු සීගිරිය
(v) පැන්සලක් කතා කරයි. (ලකුණු 20)

(2) පාසලේ පැවැත්වූ තෑගිදීමේ උත්සවය පිළිබඳව විස්තර කරමින් දුර බැහැර ප්‍රදේශයක සේවය කරන ඔබේ මව හෝ පියාට යවන ලිපිය ලියන්න. (ලකුණු 10 )

(3) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කළුගල් තලාලයි පාරට දමන්නේ
එමගල් පැගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර අදින්නේ
කිරිගල්පොත්ත කන්දයි මේ නගින්නේ

තණ්ඩලේ දෙන්නා දෙපොළේ දක්කනවා
කටු කැලේ ගාල නො ලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව් කළ ගොනෝ ඇඳපන් හපුතල් යනවා

(i) මෙම කවිවලට අනුව ගොන් කුර ගෙවීමට හේතුව කුමක් ද?
(ii) මෙම කවිවල දැක්වෙන පරිදි බර අදින්නේ කවුරුන් ද?
(iii) ඉහත සඳහන් කවියක කියැවෙන පරිදි බඩ දන්නේ කුමන හේතුව නිසා ද?
(iv) කවිවල සඳහන් කඳු දෙකක නම් ලියන්න.
(v) මෙම කවි අයත්වන ජනකවි වර්ගය කුමක් ද? (ලකුණු 2 x 5 = 10)

(4) නිවැරදි අක්ෂරය වරහන් තුළින් තෝරා ගෙන සම්පූර්ණ වචන ලියන්න.

(i) .................. මයා (ළ /ල)
(ii) ප්‍රබුද් ............. (ධ /ද)
(iii) ප...........තුරු (ළ /ල)
(iv) ක............ෂ්ඨ (ණි /නි)
(v) විශේ............ (ස /ෂ)
(vi) ප්‍රති............ල (ප /ඵ)
(vii) පුස්...........කාලය (ත /ථ)
(viii) ගැහැ...........ය (ණි /නි)
(ix) පරි.............ණකය (ස /ග)
(x) විවි............. (ධ /ද) (ලකුණු 1 x 10 = 10)

(5) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අපගේ මාතෘභූමිය ශ්‍රී ලංකාවයි. වන්දනීය වූ ඒ මාතෘභූමිය පිළිබඳව අපට ඇත්තේ මහත් අභිමානයකි. මාතෘභූමි, ජන්මභූමි, නිජ භූමි, ජාත භූමි යන යෙදුම්වලින් කියැවෙන උත්තමාර්ථය වන්නේ මව්බිම හෙවත් උපන් බිමයි. මවත්, මව්බිමත් දෙව්ලොවටත් වඩා උසස් කොට පැරැණියන් විසින් සලකන ලද බව පෙනේ.

(i) 'අප උපන් රට ශ්‍රී ලංකාවයි.' යන අදහස කියැවෙන මෙම ඡේදයේ ඇතුළත් වාක්‍යය උපුටා දක්වන්න.
(ii) 'ආඩම්බරය' යන අදහස ඇති වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.
(iii) 'මව්බිම' යන වචනයට සමාන තවත් වචන දෙකක් ලියන්න.
(iv) දෙව්ලොවටත් වඩා උසස් කොට පැරැණියන් විසින් සලකා ඇති වස්තූන් දෙකක් පිළිබඳව ඡේදයෙහි සඳහන් වේ. ඒවා නම් කරන්න. (ලකුණු 2 x 5 = 10 )

(6) පහත සඳහන් අවස්ථා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සමන් නෙළුම් හා මානෙල් ද රෝස
මලින් නැඟී ආ සුවඳත් උරා බී
හමන්නේ මේ සීත සුළං අලුත් වූ
පණක් දිදී මෙන් මට මේ වෙලාවේ

(1) මෙම කවිය උපටා ගත් පද්‍ය පන්තියෙහි නම ලියන්න.
(2) එය රචනා කළේ කවුද ?

(ii) එකම වැඩක නිතරම නොයෙදෙන්නේ
වෙන ම වෙන ම වැඩ සලකා ගන්නේ
........................................................................................
........................................................................................

ඉහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(iii) ''නුඹ වහන්සේ එන තෙක් බලා උනුම් හ.''
(1) ඉහත පාඨය කීවේ කවුද?
(2) මෙය කාහට කියන ලද්දක් ද?

(iv) ''අම්මාව එක්ක යන්නේ මමයි'' පොල්ගස්වල කෙටුම් ලකුණු බලමින් ඉදිරියෙන් ගමන් කරන පියදාසට සරත් කීවේය.
(1) ඉහත පාඨය උපුටා ගත් පොතේ නම ලියන්න.
(2) එහි කතුවරයාගේ නම ලියන්න.

(v) ''අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්නට ඇත්නම්''
(1) ඉහත පාඨය උපුටා ගත් පාඩම කුමක් ද?
(2) මේ ප්‍රකාශය කළේ කවුද?

(ලකුණු 2 x 5 = 10)

(7) පහත දැක්වෙන අතීත කාල වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.
(i) කුරුල්ලෝ ඈත අහසේ පියාසර කළහ.
(ii) මම අනුරාධපුර පූජා නගරය නැරඹීමට ගියෙමි.
(iii) ගුරුතුමිය පාඩම පැහැදිලි කළාය.
(iv) නුඹ උදෙන් ම ගමට ගියෙහි.
(v) වෛද්‍යවරු වැඩ වර්ජනය කළෝය.

(ලකුණු 2 x 5 = 10 )

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

### I කොටස

(1) (iii) (2) (iii) (3) (iv) (4) (ii) (5) (ii) (6) (iii) (7) (i) (8) (iii)

(9) අපවිත්‍ර (10) කම්මැළි (11) ප්‍රතිඵලය (12) හොඬය (13) භෞතික

(14) ර් + ඕ + ග් + ඉ + ය් + අ (15) භාග්‍යය (16) පෝෂණය (17) සතුන් (18) දූරියක

(19) ගුරුවරු (20) වෙළෙන්දා (ලකුණු 2 x 20 = 40 )

### II කොටස

(1) මාතෘකාවට අදාලව, සංවිධානාත්මකව නිර්මාණාත්මකව ලේඛන ව්‍යවහාරයෙන් ශිල්පීය දක්ෂතා භාවිත කර ලියා ඇත්නම් උචිත පරිදි ලකුණු දෙන්න. (ලකුණු 20 යි)

(2) පෞද්ගලික ලිපි ආකෘතියට අනුගතව අදාළ තොරතුරු ලියා ඇත්නම් උචිත පරිදි ලකුණු දෙන්න. (ලකුණු 10 යි)

(3)
- (i) කළුගල් පැගීම නිසා /පාරේ ගමන් කිරීම නිසා
- (ii) හරකා
- (iii) හපුතලේ කන්ද දැකීමෙන්
- (iv) කිරිගල්පොත්ත, හපුතලේ කඳු
- (v) කරත්ත කවි

(4)
(1) ළ (2) ඨ (3) ල (4) ණී
(5) ෂ (6) ප (7) ත (8) නි
(9) ග (10) ධ

(ලකුණු 1 x 10 = 10 යි)

(5)
- (1) අපගේ මාතෘභූමිය ශ්‍රී ලංකාවයි.
- (2) වන්දනා කිරීමට සුදුසු වූ / ගරු කරන
- (3) අභිමානයකි.
- (4) ජන්ම භූමි, නිජ භූමි, මාතෘ භූමි, ජාත භූමි
- (5) මව හා මව්බිම වේ.

(6)
- (1) උදයසිරි පැදිපෙළ.
  ටිබෙට් ජාතික එස් මහින්ද හිමි.
  (ඇස් මහින්ද හිමි)
- (2) පෙනුම ඇතුව හොඳ වැඩ කරපන්නේ
  තරම නොදන වැඩකට නොබසින්නේ
- (3) වානර රංචුව / වඳුරු කණ්ඩායම / වඳුරෝ
  වානර නායකයාට / වඳුරු නායකයාට /
  බෝධිසත්වයන්ට / බෝධිසත්ව වඳුරාට
- (4) රණරාළ කෘතිය
  ජී.බී. සේනානායක
- (5) චිචෙං චුලංගෙං යමු කිරි නැනෝ
  කයිරා

(ලකුණු 2 x 5 = 10 යි)

(7)
- (1) කුරුල්ලෝ ඈත අහසේ පියාසර කරති/කරන්නෝය.
- (2) මම අනුරාධපුර පූජා නගරය නැරඹීමට යමි.
- (3) ගුරුතුමිය පාඩම පැහැදිලි කරයි /කරන්නී ය.
- (4) නුඹ උදෙන් ම ගමට යහි.
- (5) වෛද්‍යවරු වැඩ වර්ජනය කරති / කරන්නෝ ය.

(ලකුණු 2 x 5 = 10 යි)